# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
# පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය

## බෞද්ධ උරුම ඩිප්ලෝමා / බෞද්ධ උරුම උසස් ඩිප්ලෝමා පාඨමාලාව
## 2026 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

මෙම පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට කැමති අපේක්ෂකයින්ගෙන් **2025.12.01 සිට 2026.01.31** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාවේ ස්වරූපය**

උක්ත පාඨමාලාව ශ්‍රී ලාංකේය බෞද්ධ උරුමයේ හරය, සුවිශේෂතා හා තීරණාත්මක ඓතිහාසික කාර්යභාරය මැනැවින් ග්‍රහණය කරගත්, එහි අනාගත පැවැත්ම සුරක්ෂිත කිරීමේ හැකියාවෙන් පරිපූර්ණ ශික්ෂණයෙන් යුතු ශාස්ත්‍රධරයෙකු බිහි කිරීම අරමුණු කර ගත්තකි. එම අරමුණු ඉටුකර ගැනීම පිණිස සැකසූ සති අන්ත පාඨමලා ලෙස මෙම පාඨමාලා හඳුන්වා දී ඇත.

**ඇතුළත්වීමේ සුදුසුකම්:**

**01 බෞද්ධ උරුම ඩිප්ලෝමා පාඨමාලාව:**

- අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම හෝ
- අ.පො.ස. (උ/පෙළ) විභාගය විෂයයන් දෙකකින් සමත්වීම සමඟ පිළිගත් ආයතනයක වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ
- පුරාවිද්‍යාව, ඉතිහාසය, උසස් සහතික පත්‍ර පාඨමාලාවක් සමත් වී තිබීම හෝ

  වෙනත් කවර ගණයේ විෂයයක් යටතේ පිළිගත් ආයතනයකින් උසස් සහතික පත්‍ර පාඨමාලාවක් සමත්ව තිබීම හෝ
- SLQF Level 2 හෝ වෙනත් සමාන සුදුසුකමක් සපුරා තිබීම හෝ
- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් සපුරා තිබීම

**02 බෞද්ධ උරුම උසස් ඩිප්ලෝමා පාඨමාලාව:**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් කවර හෝ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම හෝ
- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් පිරිනමන බෞද්ධ උරුම ඩිප්ලෝමාව සමත් ව තිබීම හෝ
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන පුරාවිද්‍යාව /ඉතිහාසය සම්බන්ධ ඩිප්ලෝමාවක් සමත් ව තිබීම හෝ

- පිළිගත් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන පුරාවිද්‍යාව හෝ ඉතිහාසය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත් ව තිබීම හෝ
- දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත්ව තිබීම හෝ
- බුද්ධධර්ම ඩිප්ලෝමා /උසස් ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත්ව තිබීම හෝ
- වෙනත් කවර ගණයේ විෂයයක් යටතේ පිළිගත් ආයතනයකින් ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම හෝ
- SLQF Level 3 හෝ වෙනත් සමාන සුදුසුකමක් සපුරා තිබීම හෝ
- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් සපුරා තිබීම

**පාඨමාලා කාලය :**

බෞද්ධ උරුම ඩිප්ලෝමා පාඨමාලාව/උසස් ඩිප්ලෝමා පාඨමාලාව : අවුරුදු 01

**මාධ්‍යය - සිංහල**

දේශන 2026 **පෙබරවාරි** මස ආරම්භ කරනු ඇත. **(දේශන භෞතිකව සහ මාර්ගගතව (Online) පැවැත්වේ.)**

**පාඨමාලා ගාස්තු:**

| | | |
|---|---|---|
| බෞද්ධ උරුම ඩිප්ලෝමා පාඨමාලාව | : | රු. 41,500/- |
| බෞද්ධ උරුම උසස් ඩිප්ලෝමා පාඨමාලාව | : | රු. 42,000/- |

**(මෙම ගාස්තු වාරික තුනකින් ගෙවිය හැකි ය)**

**අයදුම්පත් ලබා ගත හැකි ආකාරය :**

අයදුම්පත් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුවට (www.bpu.ac.lk) පිවිස බාගත කළ හැකි ය. තැපැල් මගින් අයදුම්පත් ලබාගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරන ගිණුමට බැර වන පරිදි **රු. 500/-** ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග නම, ලිපිනය ලියන ලද 9"x4" ප්‍රමාණයේ රු. 110/-ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. **චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බෞද්ධ උරුම ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත්‍ර "යනුවෙන්** සඳහන් කළ යුතු ය.

**සැ.යු. - බැංකුවට මුදල් ගෙවීමේ දී ලදුපතෙහි තැන්පත්කරුගේ නම සඳහන් ස්ථානයේ තම නම ඉදිරියෙන් "BU/Dip" යන සංකේත අංකය සඳහන් කර ඒ යටතේ ගෙවීම කළ යුතුය.**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරන ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා

ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් හෝ විශ්වවිද්‍යාලයේ සරප් කවුළුවට රු.500/- ක මුදලක් ගෙවීමෙන් ලබා ගන්නා ලද ලදුපත සමඟ අයදුම්පත් භාරදිය යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.01.31 දිනට හෝ එදිනට පෙර එවිය යුතු ය.

සහකාර ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,කොළඹ 07.

**අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

| | | |
|---|---|---|
| පාඨමාලා පිළිබඳ විමසීම් - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය බැරගම සද්ධානන්ද හිමි | : 071 837 2206 |
| | ආචාර්ය ඉෂංඛ මල්සිරි මහතා | : 071 423 1201 |
| | කාර්යාලය | : 011-2580609/011-2502944 |

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
214 බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.
2025.11.12